ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
අංක 15/12, මේට්ලන්ඩ් චන්ද්‍රවංකය,
(තැ.පෙ. 563), කොළඹ 7.
தொகைமதிப்பு புள்ளிவிபரத் திணைக்களம்
இல. 15/12, மெயிற்லண்ட் கிறசென்ட்
(த. பெட்டி. 563), கொழும்பு 7.
Department of Census and Statistics
15/12, Maitland Crescent,
(P.O. Box 563), Colombo 7.

දුරකථන/தொலைபேசி/Telephone
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General } 695291
ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் / General Office } 682176, 682177
විදුලි පණිවුඩ / தந்தி / Telegrams } "ස්ටැටිස්ටික්ස්" "ஸ்டட்டிஸ்டிக்ஸ்" "Statistics"
ෆැක්ස්/பெக்ஸ்/Fax 94 - 1 - 695291


මගේ අංකය / எனது இல. / My No. } 3/CA/MF
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2002 -04-08

සාමාන්‍යාධිකාරි,
රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව,

**කෘෂිකර්ම සංගණනය - 2002 අගෝස්තු**
**<u>පාසල් ළමුන් සඳහා මුද්‍රණය කර බෙදාහරින අභ්‍යාස පොත්වල ශීර්ෂ පාඨයක් ඇතුළත් කිරීම</u>**

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පසුගිය වසරේ පවත්වනු ලැබූ ජන හා නිවාස සංගණනයේ ප්‍රශ්නමාලා අතිවිශාල සංඛ්‍යාවක් සහ රාජ්‍ය හා සංස්ථා අංශයේ සංගණනයේ ප්‍රශ්නමාලා දශ ලක්ෂයක් පමණ ද මැනවින් මුද්‍රණය කොට දීම පිළිබඳව කෘතඥවෙමි.

02 මෙම වර්ෂයේ අගෝස්තු මාසයේ දී ආරම්භ කිරීමට සැළසුම් කොට ඇති කෘෂිකර්ම සංගණනය - 2002 හි ආකෘති පත්‍ර දශලක්ෂ 2 කටත් වැඩි ප්‍රමාණයක් මුද්‍රණය කිරීමේ කාර්යය ඉටුකර ගැනීම සඳහා ඔබ ආයතනය වෙත දැනටමත් ඇනවුම් ඉදිරිපත් කොට ඇත.

03 කෘෂිකර්ම සංගණනය - 2002 සඳහා පාසල් ළමුන් දැණුවත් කිරීම සඳහා අප දෙපාර්තමේන්තුව ට දක්වන අනුග්‍රහයක් වශයෙන් ඔබ සංස්ථාවෙන් නිෂ්පාදනය කරනු ලබන අභ්‍යාස පොත් වල පිට කවරයේ ' <u>කෘෂිකර්ම සංගණනය - 2002 අගෝස්තු</u>' යනුවෙන් ශීර්ෂ පාඨයක් මුද්‍රණය - සහ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල සිත්ගන්නා පින්තූරයක් අයකිරීමකින් තොරව මුද්‍රණය කොට දීමෙන් මෙම ජාතික කටයුත්ත සාර්ථක කරගැනීමට අනුග්‍රහය දක්වන්නේ නම් අතිශයින් කෘතඥවෙමි.

ඒ.ජී.ඩබ්. නානායක්කාර
ජන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්